www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ධනවාදයේ ලෝක අර්බුදය හා සමාජවාදය සඳහා ඉදිරි දැක්ම

## හතර වන කොටස

**The world crisis of capitalism and the prospects for socialism
Part four**


**නික් බීම්ස් විසිනි**
**2008 පෙබරවාරි 4**

*පහත පලවන්නේ ජනවාරි 21 සිට 25 දක්වා ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවරදී හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ විසින් පවත්වන ලද ජාත්‍යන්තර පාසැලට නික් බීම්ස් විසින් ඉදිරිපත්කරන ලද ආරම්භක වාර්තාවේ හතර වන කොටස යි. බීම්ස් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙක් වන අතර ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම්ය.*


ඊට පෙර දශකය තුල ලාභානුපාතිකයේ වැටීම ද ඉන් පැන නංවනු ලැබූ උග්‍ර ආර්ථික ගැටලු ද කෙරෙහි ප්‍රාග්ධනයේ ප්‍රතිචාරය 1980 දශකයේ දී දක්නට ලැබුනි. පලමුව හා ප්‍රධානව එම ප්‍රතිචාරය සමන්විත වන්නේ කම්කරු පන්තියට එරෙහි අද දක්වා ම සිදුවන ප්‍රහාරයකින් ද පෙර යටත් විජිත රටවලින් අතිරේක ලාභ හා ආදායම් උකහා ගැනීමේ එවැනි ම ක්‍රියාවලියකින් ද වේ. මෙම පියවරයන් සමඟ ම කාර්මික ක්‍රියාවලීන් ද කලමනාකරනය ද යන දෙඅංශයේ දී ම පරිගනක ඇතුලු තොරතුරු තාක්ෂනය යොදාගැනීම මඟින් කර්මාන්තයේ ප්‍රතිව්‍යුහකරනයක් සිදු වී ඇත.

පරිගනකය පශ්චාත් යුද්ධ අවධිය ආරම්භයේ දී වර්ධනය කරන ලදී; 1950 ගනන්වල දී ම ට්‍රාන්සිස්ටරය වර්ධනය කර තිබුනි; එහෙත් පුද්ගල පරිගනකය 1981 වන තෙක් ම භාවිතයට පැමිනියේ නැත. පරිගනකය භාවිතයට ගැනීමත් සමඟ තොරතුරු හුවමාරුවේ හා සමාජ ජීවිතයේ සියලු ක්ෂේත්‍රයන්හි කලමනාකරනය හා වැඩ රටා සමස්තයේ ම ඉමහත් පරිවර්තනයක් සිදුව තිබේ.

එහෙත්, මෙම වෙනස්කම් 1980 ගනන්වල ලාභානුපාතයේ ඉහල නැඟීමකට දායක වුව ද ධනේශ්වර සංවර්ධන වක්‍රයේ නව ඉහල නැඟීමක් සනිටුහන් කලේ නැත. පහත දැක්වෙන ප්‍රස්ථාර දෙක පිරික්සීමෙන් මෙය දැකගත හැකිය.




(ධනවාදී වර්ධනයේ දිගු රැලි හා ඓතිහාසික ප්‍රවනතා මින් කි ලී)




(මූලාශ්‍රය: එක්සත් ජනපදයේ ආර්ථික විශ්ලේෂන කාර්යංශය)

අප එක්සත් ජනපදයේ ලාභානුපාතිකය විදහා දක්වන දෙවන ප්‍රස්තාරය දෙස බලතොත් 1980 ගනන්වල ආර්ථිකයේ එතරම් ප්‍රබල නොවූව ද යම් සුවවීමක් දැකගත හැකිය. එම සීමිත සුවවීමකට පෙර, දශකය මැද භාගයේ පිරිහීමක් ද 1991-92 පසුබෑමේ පසුතලයට සම්පාත වෙමින් දශකය අවසානයේදී තවත් පහත වැටීමක් ද දැකිය හැක.

1990 ගනන්වල ආරම්භයේ කල්ඇල්ලූ පිබිදීමක් ද ඉන්පසු 1997 සිට 2001 පමන දක්වා තියුනු වැටීමක් ද ඇතිවිය. මෙම වසර වනාහී කොටස් වෙලඳපොල බුබුල පිම්බී ආ සමයයි. 2000-2001 කොටස් වෙලඳපොලෙහි බිඳ වැටීමට හේතු ඉතා පැහැදිලිය: කොටස් මිල ඉහල මට්ටම්වලට නැගෙද්දී එම කොටස් විසින් හිමිකම් පාන්නා වූ (ලාභ) ආදායම් ප්‍රවාහය පහලට ඇදවැටුනු අතර එන්රොන් හා වර්ල්ඩ්කොම් වැනි සමාගම් එම කාරනය ව්‍යාජ ගිනුම් මගින් සැඟවීමට උත්සාහ කලහ.

1991 හැරීමට ද ධනේශ්වර සංවර්ධන චක්‍රයේ ආරම්භවූ නව ඉහල නැග්මට ද කවර හේතු මුල් වූයේද? නිසැකව ම එය නම් ධනේශ්වර ඉතිහාසයේ, අතිශයින්ම වඩාත් දුර දිග යන උපරි ව්‍යුහාත්මක වෙනසක් විය. එය වනාහී ස්ටැලින්වාදී පාලන තන්ත්‍රයන්හි බිඳ වැටීම ද, චීනය විවෘත කිරීම හා ඉන්දියාව වැනි රටවල් විසින් අනුගමනය කල ජාතික ආර්ථික පිලිවෙත්වල අවසානය ද වේ. "ධනේශ්වර සංවර්ධන චක්‍රය" නම් සිය ලිපිය තුල ට්‍රොට්ස්කි පැහැදිලි කලේ එවන් දීර්ගකාලීන ඉහල නැඟීමක් වනාහී ධනේශ්වර ආර්ථිකය තුලම ඇතිවන ආවේනික ක්‍රියාවලීන්ගේ නිමැවුමක් නොව "නව රටවල් හා මහාද්වීප අත්පත්කර ගැනීම" වැනි ධනවාදී වර්ධනයේ බාහිර කොන්දේසි වෙනස්වීමේ ප්‍රතිඵලය බවයි. සිදුවූයේ හරියට ම මෙයයි.

නව ධනේශ්වර ඉහල නැඟීමක හැකියාවක් ඇතිකරන්නාවූ කොන්දේසි වසර බොහෝ ගනනකට පෙර ට්‍රොට්ස්කි පෙන්වාදී තිබුනි. "සත්තකින්ම, වඩාත් බලගතු, අධිපති හා ප්‍රමුඛ රටවල පොදු ධනේශ්වර ප්‍රගතියේ නව අවධියක් න්‍යායිකව බැහැර දැමිය හැක්කේ නොවේ. එහෙත් මේ සඳහා ධනවාදය විසින් ප්‍රථමයෙන්ම පන්තිමය ස්වභාවයක් දරන්නා වූ ද එමෙන්ම අන්තර් රාජ්‍ය ස්වභාවයක් දරන්නා වූ ද ඉමහත් බාධක ජයගත යුතුව ඇත. එසේ කිරීමට නම් ධනවාදය දිගු කලකට නිර්ධන පන්ති විප්ලවයේ ගෙල සිර කල යුතුය. එය චීනය මුලුමනින්ම වහල් භාවයට ගත යුතුය. සෝවියට් සමූහාන්ඩුව පෙරලා දැමිය යුතු ය. යනාදි වශයෙනි." (ට්‍රොට්ස්කි, *The Third International After Lenin,* ලෙනින්ගෙන් පසු තුන්වන ජාත්‍යන්තරය, නිව්පාක් ප්‍රකාශන, 1974, පිටු 61-62)

ට්‍රොට්ස්කි සංකල්පනය කලේ ධනවාදය විසින් චීනය හා සෝවියට් සංගමය යටත් කර ගත හොත් එය මිලිටරිමය වශයෙන් සිදුකරනු ඇති බවටය. එහෙත් ඉතිහාසය ගත්තේ වෙනස් මඟකි.

සෝවියට් සංගමයේ බිඳවැටීම පදනම් වූයේ ආර්ථික ක්‍රියාවලීන් වුවත් ධනවාදයේ පුනස්ථාපනය ඉබේම හෝ අනිවාර්යයෙන් සිදුවූවා නොවේ. පරිගනක භාවිතමගින් තාක්ෂනික වර්ධනයේ හැකියාව ඇතිකල නව යුගය තුල සෝවියට් ආර්ථිකයේ වැඩෙන අකාර්යක්ෂමතාවයන් ද, අවසාන විග්‍රහයේදී ජාත්‍යන්තර ශ්‍රම විභජනයෙන් හුදෙකලාවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රම ඵලදායීතාවය ඉහල නැංවීමෙහිලා සෝවියට් ආර්ථිකයේ නොසමත්කම ද සිය පාලනය ම ප්‍රශ්නයට බඳුන්කරන්නා වූ කම්කරු පන්තියේ පෙරලිකාරිත්වයක් පැනනංවතැයි. ස්ටැලින්වාදී නිලධරය බියට පත් විය. 1980-81 පෝලන්ත වර්ධනයෝ මෙවැන්නක් පිලිබඳව අනතුරු ඇඟවීමේ සලකුනක් වූහ.

මෙම තර්ජනයට මුහුනපා සිටි ස්ටැලින්වාදී නිලබලතන්ත්‍රය පූර්ව භංග ප්‍රහාරයක් සැලසුම් කලේය. එනම් ධනේශ්වර දේපල රූපාකාරයන්ගේ සැකිල්ල තුල සිය වරප්‍රසාද හා සමාජ තත්වය තහවුරු කර ගැනීමට මග පාදා ගැනීම සඳහා සෝවියට් සංගමය දියකර හැරීමයි. අප ඒ කාලයේදීත් අවධාරනය කල පරිදි ඔවුන්ට සාර්ථකත්වය අත් කර ගැනීමට හැකිවීම පෙන්නුම් කලේ සෝවියට් හා ජාත්‍යන්තර කම්කරු පන්තියේ ඉදිරි දර්ශනය පිලිබඳ අර්බුදයයි. එය වනාහි සෝවියට් සංගමය තුල මාක්ස්වාදය මහා ජන ඝාතනයකට ලක් කරනු ලැබීමත්, ප්‍රධාන ධනපති රටවල කම්කරු පන්තිය තුල දශක ගනනාවක් පැවති නිලධාරිවාදී ආධිපත්‍යයේ මාරක බලපෑමත් යන දෙකරුන මගින් කම්කරු පන්තියේ දේශපාලන විඥානයට සිදුකැරුනු ඉමහත් විනාශයේ විපාකයක් විය. සෝවියට් සංගමය දියකර හැරීමට එරෙහි දේශපාලන විරුද්ධත්වයක් වර්ධනය වී නම්, සිද්ධීන් බෙහෙවින් වෙනස් මාවතක් ගතහැකිව තිබුනි. වෙනස් ලෙසකින් කිවහොත් සෝවියට් සංගමයේ අර්බුදය මුල්බැස තිබුනේ ආර්ථික ක්‍රියාවලීන් තුල නමුත් සෝවියට් සංගමය දියකර හැරීම හා "ධනවාදය විසින් අලුත් රටවල් හා මහාද්වීප අත්පත්කර ගැනීම" උපරි ව්‍යුහාත්මක සාධකයන්ගේ ප්‍රතිඵලය විය.

1971 එක්සත් ජනපදය සමඟ ඇති කර ගත් සමීප සබඳතා පදනම් කර ගත් මාවෝවාදී නිලධරය 1978 පටන් චීනය තුල වෙලඳපොල ආර්ථිකයට නැමුනු ප්‍රතිපත්තියක් අනුගමනය කලහ. මෙම ප්‍රතිපත්ති නිශ්චිත ආර්ථික ජවයක් සම්පාදනය කලේවී නමුත්, 1989 සිදුවීම හා ටියනන්මෙන් චතුරස්‍රයේ සංහාරය තුලින් පැනනැගි ආකාරයේ සමාජ ප්‍රතිවිරෝධයන් මාලාවක්ද ජනිත

කලේය. එම සාකනයේ දී චීන පාලන තන්ත්‍රයේ ඉලක්කය වූයේ ශිෂ්‍යයන් නොව කම්කරු පන්තියයි.

1991 දී සෝවියට් සංගමය බිඳවැටීම හමුවේ චීන පාලන තන්ත්‍රය නව ගැටලු මාලාවකට මුහුන පෑවේය. සෝවියට් සංගමය දියකර හැරීමෙන් යන්තම් සති අටකට පසුව ඩෙන් ෂියාවෝ පිං ඔහුගේ "දක්ෂින සංචාරය" ආරම්භ කලේ, චීන අර්ථිකය විදේශ ආයෝජනවලට විවෘත කිරීම හා රටතුල වෙලඳපොල ප්‍රතිසංස්කරන මාලාවක් ක්‍රියාවට නැගීම ඇඟවුම් කරමින්ය. 1992 දී 8500 කට වැඩි නව ආයෝජන කලාප ගොඩ නඟනු ලැබිනි. ඩෙන්ගේ සංචාරයට පෙර තිබුනේ සියයක් පමනි.

සීමාකාරී නීති ඉවත්කිරීමෙන් පසුව විදේශ ආයෝජන ගලා ඒම 1992 දී ඩොලර් බිලියන 11 දක්වා තෙගුනයකින් පමන වැඩිවිය. එය 1994 දී යලිත් බිලියන 34 දක්වා තෙගුනයකින් වැඩිවූ අතර දශකයකට පසුව 2004 දී වසරකට බිලියන 61 දක්වා දෙගුනයකින් පමන ඉහල ගියේය. 2005 වසර අවසානයේ චීනය තුල කුමන ආකාරයක හෝ ව්‍යාපාරික කටයුතුවල යෙදී සිටි ඇමරිකානු සමාගම් සංඛ්‍යාව 50,000 ක් පමන විය. 1978 පටන් චීන අර්ථිකය වසරකට සියයට 9 න් පමන ද, පසුගිය 15 වසර තුල සියයට 10 කට සමීපව හා සමහර විට ඊටත් වඩා ද වැඩිවී තිබේ.

චීනය ගෝලීය ධනේශ්වර ආර්ථිකයේ ප්‍රධාන නිෂ්පාදන මධ්‍යස්ථානය ලෙස මතුව ආවේය. සියයට 5 සිට සියයට 14 දක්වා වේගයෙන් ඉහල නැගි ප්‍රාග්ධන සමුච්ඡයේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය 25 වසරේ ලෝක දල ජාතික නිෂ්පාදනයෙන් (දදේනි) චීනයේ පංගුව තෙගුනයක් තරම් විය. ( ඇන්ඩෘ ග්ලින්, *Capitalism Unleashed,* මුදාහල ධනවාදය, ඔක්ස්ෆර්ඩ් යුනිවර්සිටි ප්‍රෙස්, 2006, 90 වන පිටුව)

පසුගිය 25 වසරේ නිර්යාත කල ලෝක නිෂ්පාදනයේ කොටසක් ලෙස ගත්කල චීනයේ නිර්යාත නිෂ්පාදනයේ වැඩිවීම දශ ගුනයක් වී තිබේ. 1990 පටන් චීනයේ අපනයන වර්ධනය, සමස්ත අර්ථයෙන් ගත්කල, ඊලඟ ලොකුම අඩු වැටුප් ගෙවුම් නිෂ්පාදිත අපනයන රටවල මුලු අගයට වඩා වැඩිය. චීන නිෂ්පාදකයන්ගෙන් තුනෙන් එකක් පමන නිෂ්පාදනය කරනු ලැබුවේ වැඩි පංගුවක් ජපානයට අයත් වූ විදේශ හිමිකම් සහිත කම්හල් තුලය. ඒවාතුල සවිකර තිබුනේ ජපානයෙන් චීනය ආනයනය කැරුනු යන්ත්‍රෝපකරන හා උපාංගය. (ග්ලින්, 90-91 පිටු)

1997-98 ආසියානු මූල්‍ය අර්බුදයේ තීරනාත්මක ප්‍රති විපාකයන්ගෙන් එකක් ඉන් දස වසරක ඇවෑමෙන් වඩාත් පැහැදිලිව මතුවන්නේය. දකුනු කොරියාව හැර ආසියානු ව්‍යාඝ්‍ර ආර්ථිකයන්, සියයට 10 ත් වඩා එම අර්බුදයේ දී නිමැවුම අහිමිවීමක් අත් විඳීමෙන් පසු දැන් ලබන්නේ, 1997 ට පූර්ව වසරවල අත්කරගත්තාට වඩා සියයට 2 න් පහල වර්ධනයකි. අර්බුදයට පෙර ව්‍යාඝ්‍රයන් ක්‍රියාත්මක වූයේ එක්සත් ජනපදයේ හා යුරෝපීය වෙලඳපොලවල් සඳහා අඩු වියදම් නිෂ්පාදකයන් ලෙසය. අර්බුදයෙන් පසුව වෙනස් ව්‍යුහයක් ඉස්මතුවී තිබේ. චීනය, අග්නිදිග ආසියානු කලාපයෙන් අන්තර් භාන්ඩ හා උපාංග ආනයනයන් ආකර්ශනය කර ගන්නා ප්‍රමුඛ අඩු වියදම් නිෂ්පාදකයා බවට පත්ව තිබේ.

පූර්වයෙන් තිබූ ව්‍යුහය සමහරවිට හඳුන්වනු ලැබුවේ පියාඹන පාත්තයන්ගේ ආකෘතිය ලෙසය. එනම් ආසියානු අඩු වියදම් නිෂ්පාදකයන් ජපානය පසුපසින් ඇදීයන රටාවකි. අද ව්‍යුහය මුලුමනින්ම වෙනස් ය. චීනය යෝධ නිෂ්පාදන සංකීර්නයක මධ්‍යස්ථානය බවට පත්ව තිබේ.

ආසියානු අර්බුදයේ නොයෙකුත් අංශ පවත්නා නමුත් එක් ප්‍රධාන එකක් වූයේ 1980 ගනන් මැද භාගයේ පටන් 1990 ගනන් මැද දක්වා ඉහල වර්ධනයක් අත්දුටු ආසියානු ව්‍යාඝ්‍රයින් පසෙකට ඇද දැමීමේ හැකියාව සහිතව චීනය අඩු වියදම් නිෂ්පාදකයෙක් ලෙස ඉස්මතු වීමයි.

චීනයේ දැවැන්ත ආයෝජනය පුලුල් ක්‍රියාවලියක කොටසක් විය. ලෝක බැංකුවට අනුව "දියුනුවන රටවල් කරා ගලාගිය ඍජු විදේශ ආයෝජන (ඍවිආ), ආරම්භයේ 1990 දී බිලියන 22 ක්වූ අඩු මට්ටමක සිට දැන්, දියුනුවන රටවල මුලු දදේනි සියයට 2.5 ක් එනම් වසරකට බිලියන 200 පමනට ආසන්න වේ." දියුනුවන රටවල් දැන් ලෝකයේ මුලු ඍජු විදේශ ආයෝජනයන් ගෙන් තුනෙන් එකක් පමන ආකර්ශනය කර ගනී.

ගෝලීය ධනේශ්වර ආර්ථිකයේ ව්‍යුහය තුල ඇතිව තිබෙන වෙනස්කම්වලට හේතුවන සියලු සාධක හා සංඛ්‍යා අතුරෙන් වඩාත්ම සිත්කාවදින හා සමාජවාදී ඉදිරිදර්ශනය පිලිබඳව ගතහොත් දුරදිග යන බලපෑම් සහිත කාරනය වනාහි ගෝලීය ශ්‍රම හමුදාවේ ප්‍රසාරනයයි. මිලියන සිය ගනනක් කම්කරුවන් ගෝලීය ශ්‍රම වෙලඳපොලට ඇතුල්වීම යුග-කාරක වර්ධනයකි.

මෙම පරිවර්තනයේ තරම පිලිබඳ විවිධ ඇස්තමේන්තු තිබේ. 2006 ෆෙඩරල් රිසර්ව් බැංකුවේ බොස්ටන් සමුලුව සඳහා සකස්කල වාර්තාවක් තුල ශ්‍රමය පිලිබඳ හාවර්ඩ් අර්ථ ශාස්ත්‍රඥයෙක් වන රිචර්ඩ් ෆ්‍රීමන් තක්සේරු කලේ චීනය, ඉන්දියාව හා පැරනි සෝවියට් කඳවුරට අයත් ව තිබූ රටවල් ලෝක වෙලඳපොලට ඇතුල්වීම නිසා වෙලඳපොල ආර්ථිකයේ ශ්‍රම හමුදාව දල වශයෙන් බිලියන 1.46 සිට බිලියන 2.93 දක්වා දෙගුන වී ඇති බවටය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2007 මැයි මාසයේ දී පලකල "ලෝක ආර්ථික ඉදිරි දැක්ම" (*World Economic Outlook*) නම් සිය වාර්තාව ගෝලීය ශ්‍රම බලකායේ වර්ධනය පිලිබඳ තක්සේරුවක් ඉදිරිපත් කරයි. ගෝලීය ආර්ථිකය තුල එක් එක් රටවල ශ්‍රම බලකායේ සහභාගිත්වය මැන බලමින් - දදේනි ට අනුපාතය නිර්යාත අනුව ගනන් බලන - ජාමූඅ මෙසේ සඳහන් කරයි. "පසුගිය සිව් වසරෙහි ක්‍රියාකාරී ගෝලීය ශ්‍රම බලකාය සිව් ගුනයකින් වැඩිවී තිබේ. ගෝලීය ශ්‍රමයේ වැඩිවන තටාකය දියුනු ආර්ථිකයන් විසින් නිමි භාන්ඩ ආනයනය, අතර මැදි භාන්ඩ විදේශයන්හි ස්ථානගත කිරීම හා සංක්‍රමනය වැනි විවිධ නාලිකාවන් ඔස්සේ තක්සේරු කරනු ලැබ තිබේ."

මෙය වැඩි වශයෙන්ම ඉහල ගියේ 1990 න් පසුවය. නැගෙනහිර ආසියාව ඉන් අඩකට ද, දකුනු ආසියාව හා පැරනි සෝවියට් කඳවුරේ රටවල් සුලු වශයෙන් ද එයට දායක විය. ගෝලීය ශ්‍රම සැපයුමේ මුලු වැඩිවීමෙන් වැඩි පංගුව අඩු අධ්‍යාපනයක් ලත් කම්කරුවන්ගෙන් සමන්විත වූ අතර ඉහල අධ්‍යාපනයක් ලැබූ කම්කරුවන්ගේ සැපයුම පසුගිය විසිපස් වසර තුල සියයට 50 න් ඉහල ගියේ දියුනු ආර්ථිකයන්හි සැපයුමේ ඉහල යෑම නිසා වුවද චීනය ද ඊට දායක විය.

ගෝලීය ශ්‍රම බලකා ව්‍යුහයේ මෙම දැවැන්ත වෙනස්කම් දියුනු ධනපති රටවල කම්කරු වැටුප් මත හා ජාතික ආදායම වැටුප් හා ලාභ බෙදීයාම මත ද පුලුල් බලපෑමක් ඇතිකර තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සඳහන් කරන්නේ 1980 පටන් දියුනු ධනේශ්වර රටවල ජාතික ආදායමෙන් ශ්‍රමයේ කොටස පැහැදිලිව ම හීනවී ගොස් ඇති බවයි. එය ජාමූඅ ගනන් බලා ඇත්තේ මෙය සියයට 8 පමන වෙනසක් බවයි.

යට දැක්වෙන ප්‍රස්ථාරයෙන් මෙහි බලපෑම දැකගත හැකිය.

බොස්ටන්හි ෆෙඩරල් රිසර්ව් බැංකු සමුලුවට ඉදිරිපත් කල සිය වාර්තාවෙන් රිචර්ඩ් ෆ්‍රීමන් මෙසේ නිගමනය කලේ ය. "චීනය, ඉන්දියාව හා පැරනි සෝවියට් සංගමය කරලියට පැමිනීම මගින් ගෝලීය ප්‍රාග්ධන-ශ්‍රම අනුපාතය කම්කරුවන්ට එරෙහිව ඉමහත් වෙනසකට බඳුන්කරනු ලැබ තිබේ. දියුනු වෙමින් පවතින රටවල උසස් අධ්‍යාපනයේ ප්‍රසාරනය, උසස් අධ්‍යාපනයක් ලැබූ කම්කරුවගේ සැපයුම වැඩිකර ඇත; උතුරු-දකුනු විභේදය විසින් උතුරට පමනක් හිමිකර දී තිබුනු පරවේනි අයිතිය සහිත ඉහල ම තාක්ෂනික වර්ධනයකින් යුත් අංශවල දී පවා දියුනු රටවල් සමඟ තරග කිරීමේ ඉඩ ප්‍රස්ථා නැඟී එන යෝධයන් ලෙස සැලකෙන රටවලට හිමිකර දී තිබේ."

ගෝලීය ශ්‍රම හමුදාව දෙගුනවීම ගෝලීය ආර්ථිකය තුල ප්‍රාග්ධනයට ශ්‍රමයේ අනුපාතය සියයට 40 සිට 50 දක්වා පහත හෙලා ඇතැයි ඔහු තක්සේරු කලේය. වෙනත් වචනවලින් කිවහොත් ප්‍රාග්ධනයට සාපේක්ෂව ශ්‍රම සැපයුම ඉහල නගින විට ශ්‍රමයේ මිල එනම් වැටුප් පහත වැටේ.

2006 ජූලි මාසයේ දී *ඉකොනොමිස්ට් සඟරාව* මෙසේ සඳහන් කලේ ය. "පසුගිය වසරේ ඇමරිකාවේ බදු ගෙවීමෙන් පසු ලාභ, දදේනි සමානුපාතිකව 75 වසරකට පසු ඉහල ම මට්ටමට නැගුනි. යුරෝ කලාපයේ හා ජපානයේ ද ලාභයේ පංගුව අඩුම තරමින් පසුගිය 25 වසර තුල එහි ඉහල ම මට්ටමට ලඟාවිය. ගෝලීය ආර්ථිකය තුල චීනයේ නැඟීඒම ශ්‍රමය සාපේක්ෂ වශයෙන් බහුල වීමටත් ප්‍රාග්ධනය සාපේක්ෂව හිඟවීමටත් ඒ අනුව ප්‍රාග්ධනයේ සාපේක්ෂ ප්‍රතිලාභ ඉහල යෑමටත් තුඩු දී තිබේ."

2006 ඔක්තෝබර් 14 *ෆිනෑන්ෂල් ටයිම්ස්හි* සඳහන් කලේ බ්‍රිතාන්‍යයේ සමාගම් ලාභ 2005 වසර තුල ඉහලම මට්ටමට නැග තිබුනු අතර උද්ධමනයට ගලපන ලද මධ්‍යම තරමේ සතිපතා වැටුප් සියයට 0.4 න් පහත වැටුනු බවයි.

"බටහිර සියලු ම ධනවත් රටවල්වලට ඇත්තේ ද එම කතාන්තරයම ය. එක්සත් ජනපදය පිලිබඳ මෑත සමීක්ෂනයක් තුල එරට ආයෝජන සමාගමක් වන ගෝල්ඩ්මන් සැක්ස් සඳහන් කලේ දදේනියේ පංගුවක් ලෙස ලාභ 2006 ප්‍රථම කාර්තුවේ දී මෙතෙක් පැවති ඉහල ම මට්ටමට ලඟාවූ බවය. ලාභ සීමාවන්ගේ නැඟීම කෙරෙහි සාධක ගනනාවක් දායක වී තිබේ. ඉන් වඩාත් වැදගත් සාධකය වනාහි ජාතික ආදායමෙන් ශ්‍රමයේ පංගුව පහත වැටීමයි." යනුවෙන් එම වාර්තාව සඳහන් කරයි.

එච්එස්බීසී බැංකු ගෝලීය සමීක්ෂනයේ ස්ටෙෆන් කිං හා ජැනට් හෙන්රිගේ ඍජු ප්‍රකාශයක් අන්තර්ගත කොටසක් *ඉකොනොමිස්ට් සඟරාවෙන්* උපුටා ක් එම වාර්තාවෙහි අඩංගු කර ඇත. "ගෝලීය කරනය යනු හුදෙක් බටහිර නිෂ්පාදකයන් සඳහා නිර්යාත වෙලඳපොලවල් ගනනාවක් පැනනැඟීම පිලිබඳ කථාන්තරයක් නොව පොහොසත් කම්කරුවන් වෙතින් දුප්පත් කම්කරුවන් වෙත ද, සමස්තයක් ලෙස ශ්‍රමය වෙතින් ප්‍රාග්ධනය වෙත ද, බල ශක්තිය පාවිච්චි කරන පාරිභෝගිකයන් වෙතින් බලශක්ති නිෂ්පාදකයන් වෙත ද ආදායම යලි හරවායවන දැවැන්ත රල තරංග පිලිබඳ කථාන්තරයකි. මෙය ආර්ථික වර්ධනය පිලිබඳ හිතලුවක් නොව ජයග්‍රාහකයන් හා පරාජිතයන් පිලිබඳ කතාන්තරයකි."

ශ්‍රමයේ පංගුව පිරිහීයාම ලාභ තරකරනු ලබන එකම මාර්ගය නොවේ. ලාභ පාරිභෝගික භාන්ඩවලට හේතුව චීනය ලෝක වෙලඳපොලට පිවිසීම පමනක්ම ද නොවේ. කාර්මික යන්ත්‍රෝපකරන පිරිවැය ද පහත වැටී තිබේ. මාක්ස්වාදී දේශපාලන ආර්ථිකයේ ප්‍රවර්ගයන්ට අනුව සලකන විට ඒ වනාහි ශ්‍රම ශක්තියේ වටිනාකම පහත හෙලීම හේතු කොට ගෙන එහි සූරාකෑමේ අනුපාතය ඉහල නැඟී ඇතුවා පමනක් නොව ස්ථාවර ප්‍රාග්ධනය ලාභ වීමේ හේතුව මත ප්‍රග්ධනයේ ඓන්ද්‍රිය සංයුතිය පහත වැටීමෙන් ධනේශ්වර ආර්ථිකය පුරා සමස්තයක් ලෙස ලාභානුපාතයේ සාමාන්‍යය ඉහල නගින බවයි.

**මතු සම්බන්ධයි.**

© www.wsws.org